# මුදල් අමාත්‍යාංශය

## අභ්‍යන්තර ස්ථාන මාරු පිළිබඳ පටිපාටිය - 2016

## (රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ අධිපන්තිය)

රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ අධිපන්තියේ නිලධරයන්ගේ දෙපාර්තමේන්තු අතර අභ්‍යන්තර ස්ථානමාරු පටිපාටිය පහත දැක්වෙන පරිදි විය යුතුය. (2016.01.01 දින සිට ඉදිරියට ක්‍රියාත්මක වන ස්ථානමාරුවීම් සඳහා මෙම පටිපාටිය අදාළ වේ.)

1. (අ) මුදල් අමාත්‍යාංශයේ හෝ අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තුවක අවුරුදු 05ක අඛණ්ඩ සේවා කාලයක් ඇති නිලධාරීන්/ නිලධාරිනියන් (වෘත්තීය සමිති නියෝජිතයින්ද ඇතුළුව) ස්ථාන මාරු කරනු ලැබිය හැකිය.

   (ආ) මුදල් අමාත්‍යාංශය හෝ ඒ යටතේ වන දෙපාර්තමේන්තුවක අවුරුදු 02ක අවම සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරීන් ස්ථාන මාරුවීම් ලැබීම සඳහා සුදුසුකම් ලබයි.

2. ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ, සුරාබදු දෙපාර්තමේන්තුවේ අවුරුදු 05ක සේවා කාලයක් සම්පූර්ණ කරන නිලධාරීන් වසර 05 ක සේවය අවසන් කරන දිනයේදීම දෙපාර්තමේන්තුවලින් පිටතට ස්ථාන මාරු කරනු ලැබීමට යටත්වේ. වසර 05ක සේවා කාලය ගණනය කරනු ලබන්නේ දෙපාර්තමේන්තුවලට නිලධාරියෙකු ස්ථාන මාරු කරන ලද දින සිටය. ඒ අනුව 2015.12.31 දිනට හා එදිනෙන් පසු 2016.12.31 දින දක්වා වසර 05 සම්පූර්ණ කරන නිලධාරීන් ස්ථානමාරු කිරීම්වලට යටත්වේ.

3. ඉහත 02 හි සඳහන් දෙපාර්මේන්තුවල මීට පෙර සේවය කර ඇති නිලධාරීන් නැවතත් එම දෙපාර්තමේන්තුවලට ස්ථාන මාරු නොකරන අතර, 2016 වර්ෂය සඳහා වාර්ෂික ස්ථාන මාරුවීම් වලට අදාළ රා.ප.ච. 20/2015 හි 01වන උපලේඛනයේ දක්වා ඇති දෙපාර්තමේන්තුවක හෝ ද්වීතියන පදනම මත ප්‍රතිලාභ සහිත ආයතනයක සේවය කර ඇති නිලධාරීන්ද ඉහත අංක 02 හි සඳහන් දෙපාර්තමේන්තු/ ආයතනවලට ස්ථාන මාරු කරනු නොලැබේ. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 20/2015හි වාර්ෂික ස්ථාන මාරු පටිපාටියේ 05:9:2 ඡේදයේ සඳහන් කරුණු ද මීට අදාළ කරගනු ලබන්නේ ප්‍රතිලාභ සහිත දෙපාර්තමේන්තුවල සේවය සඳහා වූ පොරොත්තු ලේඛනයේ සිටින නිලධාරීන්ට අගතියක් නොවන පරිදිය.

4. රේගු, දේශීය ආදායම් හා සුරාබදු දෙපාර්තමේන්තුවලට ඉල්ලා ඇති ස්ථාන මාරු අයදුම්පත් සලකා බලනු ලබන්නේ ඉදිරි වර්ෂයට එම දෙපාර්තමේන්තුවල ඇති වන පුරප්පාඩු සංඛ්‍යාව සැලකිල්ලට ගෙනය.

5. මුදල් අමාත්‍යාංශයේ හා භාණ්ඩාගාර දෙපාර්තමේන්තුවල අඛණ්ඩව වැඩිම සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරීන් මේ යටතේ ස්ථානමාරුවීම් සඳහා සුදුසුකම් ලබයි. එකම දිනයේදී අමාත්‍යාංශයට පැමිණ ඇති නිලධාරීන්ගේ ප්‍රමුඛතාවය තීරණය කරනු ලබන්නේ ඔවුන්ගේ මුළු සේවා කාලය හා මෙයට පෙර ප්‍රිය මනාප සේවා ස්ථාන වල සේවය සැලකිල්ලට ගෙනය. මුළු සේවා කාලය ද සමාන වන අවස්ථාවල දී නිලධාරියාගේ ඉදිරියට ඇති සේවා කාලය සැලකිල්ලට ගනු ලැබේ. (අවම සේවා කාලය සැලකිල්ලට ගනු ලබන්නේ ස්ථානමාරුවීම් සඳහා පොරොත්තු ලේඛනය පවතින අවස්ථාවන්හි දීය)

6. රජයේ ගැසට් නිවේදනයක් මඟින් හෝ රජයේ ප්‍රතිපත්ති තීරණ මත මුදල් අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තුවක් වෙනත් අමාත්‍යාංශයක් යටත්ට පත් කරනු ලැබූ අවස්ථාවකදී මුදල් අමාත්‍යාංශය යටතේ ඇති ප්‍රතිලාභ ලබන දෙපාර්තමේන්තුවකට ස්ථාන මාරු ඉල්ලුම් කිරීමේදී එම ගැසට් නිවේදනයේ හෝ ප්‍රතිපත්ති තීරණ ක්‍රියාත්මක වන දිනය වන විට එම දෙපාර්තමේන්තුවේ සේවය කරන ලද නිලධාරීන්ට පමණක් ස්ථාන මාරු ඉල්ලුම් කළ හැකිය.

7. අභ්‍යන්තර වාර්ෂික ස්ථානමාරු අයදුම්පත් කැඳවීමේ දී දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් නිර්දේශ නොකර ඉදිරිපත් කරන ඉල්ලුම්පත් සම්බන්ධයෙන් එසේ නිර්දේශ නොකිරීමට හේතුන් ද සඳහන් කර එවිය යුතු අතර, ඒ සම්බන්ධයෙන් ස්ථාන මාරු කමිටුව විසින් අමාත්‍යාංශ ලේකම්තුමාගේ එකඟතාවය මත ස්ථාන මාරු කිරීමට අදාළ තීරණ ගනු ලැබේ. ස්ථාන මාරුවීම් ලද නිලධාරියෙකු අදාළ දිනයේ දී වැඩ බාර ගැනීමට හැකි වන පරිදි මුදාහැරීම අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සිදු කළ යුතුය.

8. ප්‍රිය මනාප දෙපාර්තමේන්තුවලට වාර්ෂික ස්ථාන මාරු කිරීමෙන් පසුව එම වර්ෂයේ ඉදිරියට ඇතිවන පුරප්පාඩු පිරවීම සඳහා පොරොත්තු ලේඛනයක් වාර්ෂිකව සකස් කරනු ලබන අතර, එම පොරොත්තු ලේඛනවලින් බැහැරව ස්ථානමාරුවීම් කරනු නොලැබේ.

9. විශ්‍රාම යාමට ආසන්න නිලධාරියෙකු ප්‍රිය මනාප දෙපාර්තමේන්තුවකට ස්ථානමාරු කිරීම සම්බන්ධයෙන් සලකා බැලීම සඳහා සළකා බලනු ලබන වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වයස අවුරුදු 55 සම්පූර්ණ කල යුතු අතර, අවම වශයෙන් අමාත්‍යාංශය යටතේ සේවා කාලය අවුරුදු 02 ක් සම්පූර්ණ කර තිබිය යුතුය. (මේ සම්බන්ධයෙන් සළකා බලනු ලබන්නේ පවතින පුරප්පාඩු සංඛ්‍යාවෙන් 5:1 යන අනුපාතයෙනි.)

10. ප්‍රිය මනාප සේවා ස්ථානයක සේවය කර ඇති නිලධාරියෙකු එම ආයතනයේ සේවා කාලය වසර 05ක් නොඉක්මවූ විට ඉතිරි කාලය මෙම අමාත්‍යාංශය යටතේ වන ප්‍රිය මනාප දෙපාර්තමේන්තුවක සේවය කිරීමට ඉහත 1 හි කොන්දේසි වලට යටත්ව අවස්ථාව ලබා දිය හැකිය. ප්‍රිය මනාප සේවා ස්ථානවල ගත කළ සේවා කාලය ගණනය කිරීමේදී, පූර්වාසන්න වසර 15 තුළ සේවය කළ (එම කාල පරිච්ඡේදවල ප්‍රිය මනාප යයි හඳුන්වනු ලැබූ) ප්‍රිය මනාප සේවා ස්ථාන කිහිපයක වුවද සේවා කාලයන්ගේ එකතුව ගණන් ගනු ලැබේ.

11. ප්‍රිය මනාප සේවා ස්ථානයක නියමිත කාලය සේවය කර ඇති නිලධරයන් නැවත ප්‍රිය මනාප සේවා ස්ථානයකට ඉල්ලීම් කිරීමට සුදුසුකම් ලබන්නේ ප්‍රිය මනාප සේවා ස්ථානයේ (අදාළ කාල පරිච්ඡේදයන්හි ප්‍රිය මනාප යැයි සලකනු ලැබූ ) සිට ස්ථානමාරු ලැබීමෙන් වසර 15 ක කාලයක් ගත වූ පසුව වේ. මෙහි දී (රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III/II/I යන සේවා කාලය තුළ ප්‍රිය මනාප සේවා ස්ථානයක සේවය කර ඇත්නම් එය ද ගණනය කරනු ලැබේ.) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 20/2015 හි වාර්ෂික ස්ථාන මාරු පටිපාටියේ සඳහන් ප්‍රිය මනාප සේවා ස්ථානයන් මෙම පටිපාටියේ අවශ්‍යතා සඳහා ද ප්‍රියමනාප සේවා ස්ථාන ලෙස සලකනු ලැබේ.

12. ප්‍රිය මනාප සේවා ස්ථානයක හෝ ස්ථානවල වසර 05ක සේවා කාලයක් සම්පූර්ණ කළ නිලධරයන් නැවත ප්‍රියමනාප සේවා ස්ථානයකට මාරු කළ යුත්තේ වෙනත් ඉල්ලීම් නැත්නම් පමණි.

13. දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ, රේගු දෙපාර්තමේන්තුවේ හා සුරාබදු දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු වෘත්තිය සමිති නියෝජිතයින් සම්බන්ධයෙන් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 20/2015හි ස්ථාන මාරු පරිපාටිය අනුව කටයුතු කරනු ලැබේ. ප්‍රතිලාභ සහිත දෙපාර්තමේන්තුවක අවුරුදු 05ක් හෝ ඊට වැඩි සේවා කාලයක් සපුරා ඇති වෘත්තිය සමිති නිලධාරින් ස්ථාන මාරුවීම්වලට යටත් වන අතර, ඔවුන්ගේ කැමැත්ත අනුව අමාත්‍යාංශයට හෝ ප්‍රතිලාභ රහිත දෙපාර්තමේන්තුවකට ස්ථාන මාරුවීම් ලබා දිය හැකිය.

14. නිලධාරියෙකු විසින් කරන ලද ඉල්ලීමකට අනුව ප්‍රතිලාභ ලබන දෙපාර්තමේන්තුවකට ස්ථාන මාරුවීමක් ලබාදී ඇති විටෙක එම නිලධාරියා විසින්ම එම ස්ථාන මාරුවීම අවලංගු කර ගැනිම සඳහා ඉල්ලිමක් කර එය අවලංගු කරගන්නේ නම් ඔහුට (ඉතාමත් සාධාරණ ඉල්ලිමකට හැර) ඉදිරි වසර 03ක් දක්වා ප්‍රතිලාභ ලබන දෙපාර්තමේන්තුවකට ස්ථානමාරු වීම සඳහා ඉල්ලුම් කිරීම සඳහා ඇති හිමිකම් අහිමිවනු ඇත.

15. ප්‍රතිලාභ ලබන දෙපාර්තමේන්තුවක සේවය කරන අතරතුර රජයේ ප්‍රතිපත්තිමය තීරණයක් නොවන අවස්ථාවකදි විදේශ ගතවුවවොත්, එනම් පෞද්ගලික නිවාඩු මත විදේශ ගතවිමේ දී එම විදේශ ගතවී සිටින කාලය ප්‍රතිලාභ ලබන ආයතනයක සේවා කාලයට බලපෑමක් ඇති කරනු නොලබයි. (එනම් විදේශ ගතවී සිටින කාලය ප්‍රතිලාභ ලබන සේවා කාලයෙන් අඩු කරනු නොලැබේ)

16. අභියාචනා මණ්ඩලයේ තීරණය අවසන් තීරණය වන අතර, නැවත අභියාචනා සලකා බලනු නොලැබේ. යම්කිසි නිලධාරියෙකු ස්ථාන මාරු කර ඇත්නම් ඒ අනුව නිලධාරියා නියමිත දිනයේ දී මුදාහැරිමට දෙපාර්තමේන්තු ප්‍රධානියා අනිවාර්යයෙන්ම ක්‍රියාකළ යුතුය. එසේ නොකරන්නේ නම් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීති සංග්‍රහය අනුව අදාළ බලධාරින්ට වාර්තා කිරිමට සිදුවේ. (ප්‍රතිලාභ සහිත ආයතනයක සේවය කරන ලද දැනට අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තුවල සේවය කරන ලද නිලධාරීන් පිටතට කෙරෙන ස්ථානමාරුවලට යටත් වේ. )

17. **යම් නිලධාරියකු විසින් ස්ථානමාරුවීම් ඉල්ලුම් කිරීමේ දී අසත්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇත්නම් එම අයදුම්පත්‍රය ප්‍රතික්ෂේප කරන අතරම ඉදිරි වසර දෙක සඳහා ස්ථාන මාරුවීම් සඳහා ඉල්ලුම් කිරීමට හිමිකමක් නොලැබේ.**

18. **ස්ථානමාරුවීම් පිළිබඳ යම්කිසි ගැටළුවක් මතුවුවහොත් අමාත්‍යාංශ ලේකම්තුමාගේ තීරණය අවසන් තීරණය වේ.**